# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2135/43 - 2019 අගෝස්තු මස 07 වැනි බදාදා - 2019.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) වැනි ව්‍යවස්ථාවට හා 46(1)(අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 2103/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව, වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2019 ජූලි මස 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (16) ''කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි අංක (16) ශීර්ෂය, ''කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය'' වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 අයිතමය -

1. කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම'' වශයෙන් ;


1A - G 30694— 382 (2019/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) එහි I වැනි තීරුවෙහි 30 සිට 34 දක්වා වූ අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි I වැනි තීරුවෙහි 18 අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

19. ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූල්‍යාධාර සම්පාදනය

(ඉ) එහි I වැනි තීරුවෙහි අයිතම 19 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි 21 සිට 24 දක්වා වූ අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(උ) එහි II වැනි තීරුවෙහි 14 අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

15. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන

(ඌ) එහි II වැනි තීරුවෙහි අයිතම 15 සිට නැවත අංකගත කිරීමෙන් ;

(එ) එහි III වැනි තීරුවෙහි දක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- සත්ත්ව රෝග පනත (1992 අංක 59)
- සත්ත්ව ආහාර පනත (1986 අංක 15)
- සත්ත්ව පනත (1958 අංක 29)
- පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)

(2) එම නිවේදනයෙහි අංක (18) ''රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි : -

(අ) එහි අංක (18) ශීර්ෂය ''රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍ය'' වශයෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි 1 අයිතමය -

1. රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම'' වශයෙන් ;

(ඇ) එහි I වැනි තීරුවෙහි 24 අයිතමය ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි I වැනි තීරුවෙහි 23 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

24. පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම
25. සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු
26. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
27. නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
28. පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝගවලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු

(ඉ) එහි I වැනි තීරුවෙහි අයිතම 28 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඊ) එහි II වැනි තීරුවෙහි 11 අයිතමය ඉවත් කිරීමෙන් ;

(ළ) එහි II වැනි තීරුවෙහි 10 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

11. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
12. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්
13. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
14. සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිස් සමාගම

(ළු) එහි III වැනි තීරුවෙහි දැක්වෙන "ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත (2005 අංක 13) ට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

- සත්ත්ව රෝග පනත (1992 අංක 59)
- සත්ත්ව ආහාර පනත (1986 අංක 15)
- සත්ත්ව පනත (1958 අංක 29)
- පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)

08 - 813